## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

(11 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 11 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 11 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | |
| 1. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1''ප්‍රාසංගික කලාව'' හඳුන්වයි. | ■ ප්‍රාසංගික කලාව යන්න නිර්වචනය කරයි.<br>■ ප්‍රාසංගික කලාවට අයත් විෂය ක්ෂේත්‍ර හඳුනාගනියි.<br>■ ඒ ඒ කලාංගයට ආවේණික සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන ලේඛනගත කරයි. | ■ සංගීත සංදර්ශනයක, නර්තන සංදර්ශනයක, මුද්‍රා නාට්‍යයක, ඔපෙරාවක, වේදිකා නාට්‍යයක ප්‍රාසංගික බව හඳුනාගැනීම. | 1. 1.1 ප්‍රාසංගික කලා හඳුනාගනිමු. | 01 |
| | | ■ නාට්‍යයක අන්තර්ගත කලාංග පිළිබඳව විමසයි.<br>■ විවිධ කලා මාධ්‍යයන්ගේ භාවිතය පිළිබඳ අවශ්‍යතාව තේරුම් ගනියි.<br>■ විවිධ කලාවන් අතර නාට්‍යයට හිමි තැන අවබෝධ කරගනියි.<br>■ ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ක්ෂණික ව වෙනස්වීම් කළ හැකි බව වටහාගනිය | ■ නාට්‍යයක ප්‍රාසංගික බව<br>■ නාට්‍යයක ඇතුළත් විවිධ කලා මාධ්‍යයන්<br>■ සජීවී බවෙහි ඇති සුවිශේෂත්වය<br>■ නාට්‍යය වෙනත් කලා මාධ්‍යයන් සමග සැසඳීම.<br>■ නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සහභාගී වන පිරිස | 1.1.2 සෙසු ප්‍රාසාංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂී ලක්ෂණ හඳුනාගැනීම. | 01 |
| | 1.2 රංග ආලෝකකරණය හඳුනා ගනියි. | ප්‍රොසීනියම් වේදිකාවක අඳුර පලවා හැරීමට උපක්‍රම යෝජනා කරයි.<br>■ ආහාර්ය අභිනයේ විශේෂ අංගයක් වශයෙන් රංගාලෝකය වැදගත් වන බව පිළිගනියි.<br>■ වේදිකා නාට්‍යයකට රංගාලෝකයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>■ නළු කාර්යය පහසු කිරීම පිණිස ''රංගාලෝකය'' සහාය කරගනියි. | ■ රංගාලෝකය යන්න පැහැදිලි කිරීම.<br>■ රංගාලෝකයේ ඇති වැදගත්කම<br>■ රංගාලෝකයේ විකාශනය<br>■ නාට්‍ය ඇතුලත් දෘශ්‍ය පටයේ ආලෝක භාවිතය හඳුනාගැනීම.<br>■ ආදේශ උපකරණ භාවිතයෙන් ආලෝකය සපයාගැනීම.<br>■ නාට්‍යය සජීවීකරණය කිරීම සඳහා රංගාලෝකයේ වැදගත්කම | 1.2.1 වේදිකාවට ආලෝකය | 01 |
| | | ■ රංගාලෝක උපකරණ හඳුනාගනියි.<br>■ ඒ ඒ උපකරණවල කාර්යභාරයන් විස්තර කරයි. | ■ රංගාලෝකය සැපයීමේ දී භාවිත කරන ප්‍රධාන පහන් හා උපකරණ<br>■ නාට්‍යයක් සඳහා රංගාලෝකය භාවිතය | 1.2.2 ආලෝක උපකරණ හා භාවිතය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ රංගාලෝකය උපකරණ භාවිතය පිළිබඳ විවිධ අත්හදා බැලීම්හි නිරත වෙයි.<br>■ තමන්ගේ නාට්‍ය නිෂ්පාදන සඳහා රංගාලෝකය භාවිත කරයි.<br>■ වෙනත් නාට්‍ය නිෂ්පාදන සඳහා දායක වෙයි. | ■ විදුලි ආලෝක පරිපථ පිළිබඳ මූලික දැනුම | | |
| | 1.3 වේෂභූෂණ හඳුනා ගනියි. | ■ වේෂභූෂණ යන්න පැහැදිලි කරයි.<br>■ වේෂභූෂණවලින් නාට්‍යයකට ලැබෙන දායකත්වය විමසයි.<br>■ වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරයි. | ■ වේෂභූෂණ යන්න පැහැදිලි කිරීම.<br>■ නාට්‍යයකට වේෂභූෂණ යොදාගැනීමේ වැදගත්කම<br>■ ලෝකධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දැක්වීම.<br>■ නාට්‍යධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දැක්වීම.<br>■ වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු | 1.3.1 නාට්‍යයක වේෂභූෂණ | 01 |
| | 1.5 නාට්‍ය සංගීතය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසයි. | ■ නාට්‍යයක සංගීතය යෙදිය යුතු ආකාරය වටහාගනියි.<br>■ නාට්‍ය ගීතයක් ගායනා කරයි.<br>■ නාට්‍යයකට සංගීතය වැදගත් වන අයුරු ප්‍රකාශ කරයි.<br>■ නාට්‍ය ගීතවලට අනුව රංගනයෙහි යෙදෙයි. | ■ නාට්‍ය සංගීතය හඳුනාගැනීම.<br>■ නාට්‍ය සංගීතය ශෛලිය අනුව වෙනස්වන ආකාරය<br>■ නාට්‍යයේ සංගීතයෙන් ලැබෙන ප්‍රයෝජන<br>■ නාට්‍ය ගීත ගායනයේ විශේෂතා | 1.5.1 නාට්‍යයක සංගීතය ගැන සොයා බලමු. | 01 |
| | | ■ රංග වින්‍යාසය කුමක් ද යි විස්තර කරයි.<br>■ රංග වින්‍යාසයේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>■ නාට්‍යයකට රංග වින්‍යාසය වැදගත් වන අයුරු විස්තර කරයි. | ■ රංග වින්‍යාසය යනු කුමක් ද යි විස්තර කිරීම.<br>■ රංග වින්‍යාසය තුළ ඇති අංග ලක්ෂණ<br>■ රංග වින්‍යාසය තුළින් ගොඩනැගෙන සෞන්දර්යාත්මක බව. | 1.5.2 රංග රචනයේ යෙදෙමු. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.6 රංග භූමි අලංකරණය පිළිබඳ ව විමසයි. | රංගභූමි අලංකරණය යන්න විස්තර කරයි<br>■ රංගභූමි අලංකරණයෙහි විවිධතා හඳුනාගනියි.<br>■ රංගභූමි අලංකරණ නිර්මාණය කිරීමේ මූලික සිද්ධාන්ත හඳුනාගනියි.<br>■ නිර්මාණකරණය සඳහා යොදාගත හැකි අමු ද්‍රව්‍ය විස්තර කරයි. | ■ වේදිකා අලංකරණය හැඳින්වීම.<br>■ වේදිකා නාට්‍ය සඳහා අලංකරණ යොදා ගැනීමේ වැදගත්කම<br>■ වේදිකා අලංකරණ නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු | 1.6.1 රංගභූමි අලංකරණ හඳුනාගනිමු. | 01 |
| | 1.7 නාට්‍ය කලාවෙහි ප්‍රේක්ෂක සහභාගිත්වය පිළිබඳ අවධානය යොමු කරයි. | ■ ප්‍රේක්ෂකයා යනු කවරෙක් දැ යි නිර්වචනය කරගනියි.<br>■ ප්‍රේක්ෂකයා, විචාරකයකු රසිකයකු මෙන් ම විනිශ්චයකරුවකු ද වන බව ප්‍රකාශ කරයි.<br>■ ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක ගුණාත්මක බව මැනගැනීමට හේතු වන නිර්ණායක වන බව පවසයි.<br>■ ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයට අවශ්‍ය ම අංගයක් බව පෙන්වාදෙයි. | ■ ප්‍රේක්ෂකයා යන්න හැඳින්වීම.<br>■ නාට්‍යයකට අවශ්‍ය ම අංගයක් ලෙස ප්‍රේක්ෂකයාගේ වැදගත්කම<br>■ සාධාරණ විචාරය හා ප්‍රතිචාර නාට්‍යයක සාර්ථකත්වයට හේතු වන අයුරු | 1.7.1 බලමු, විඳිමු. | 01 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි. | 3.1 රංග අභ්‍යාසවල යෙදෙයි. | ■ රංග අභ්‍යාසවල නියැළෙයි.<br>■ රංග අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන සඳහන් කරයි.<br>■ රංග අභ්‍යාස වර්ග ප්‍රකාශ කරයි. | ■ රංග අභ්‍යාස යනු කුමක් දැ යි අර්ථ නිරූපණය.<br>■ රංග අභ්‍යාස වර්ග<br>■ රංග අභ්‍යාසවලින් ඇති ප්‍රයෝජන<br>■ විවිධ රංග අභ්‍යාස | 3.1.1රංග අභ්‍යාසවල වැදගත්කම හඳුනාගැනීම | 01 |
| | | ■ රංග ක්‍රීඩා විශේෂ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>■ රංග ක්‍රීඩාවල යෙදෙයි.<br>■ රංග ක්‍රීඩාවලින් ලබන ප්‍රයෝජන ඉදිරිපත් කරයි. | ■ රංග ක්‍රීඩාවක යෙදීම.<br>■ රංග ක්‍රීඩාවල ප්‍රයෝජන<br>■ රංග ක්‍රීඩා නිර්මාණය කිරීම.<br>■ රංග ක්‍රීඩා හඳුනාගැනීම. | 3.1.3 රංග ක්‍රීඩාවල යෙදෙමු. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහිඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි. | ■ කංකාරිය යනු කුමක්දැයි හඳුනාගනියි.<br>■ කංකාරියෙහි අරමුණු විමසයි.<br>■ කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ මතු කොට දක්වයි.<br>■ දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි. | ■ කොහොඹා කංකාරිය හා සම්බන්ධ පුරාවෘත්තය<br>■ කොහොඹා කංකාරියේ එන නාට්‍යමය පෙළපාලිවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ.<br>■ කොහොඹා කංකාරිය ප්‍රචලිත ප්‍රදේශ. | 4.1.1 ''කංකාරි රඟ ලකුණු විමසමු'' (සිද්ධාන්ත) | 01 |
| | | ■ පහන් මඩුව ශාන්තිකර්මයේ අරමුණු හා උපත් කතා විමසයි.<br>■ මඩු ශාන්තිකර්මය යනු කුමක් දැ යි හඳුන්වයි.<br>■ පහන් මඩුව ශාන්තිකර්මයේ නාට්‍යමය ලක්ෂණ විමසයි.<br>■ දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි. | ■ පහන් මඩුව ශාන්තිකර්මයේ උපත් කතාව<br>■ පහන් මඩුව ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු<br>■ පහන් මඩුව ශාන්තිකර්මයේ පෙළපාලිවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ | 4.1.2 මඩු රඟ ලකුණු විමසමු (සිද්ධාන්ත ) | |
| | 4.2 දේශිය ජනනාට්‍ය කලාව හඳුනාගනියි | ■ සොකරි ජන නාටකයක් ලෙස හඳුනාගනියි.<br>■ සොකරි කතාව විස්තර කරයි.<br>■ සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් විස්තර කරයි.<br>■ ගැමි සංස්කෘතියේ හර පද්ධති අගයයි. | ■ සොකරි නාටකයේ කතාව<br>■ සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ<br>■ සොකරි නාට්‍යයේ චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය<br>■ සොකරි ප්‍රචලිත ව තිබූ ප්‍රදේශ<br>■ සොකරි නාට්‍යයේ පරමාර්ථ | 4.2.1 සොකරි හඳුනාගනිමු (සිද්ධාන්ත) | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ කෝලම් යනු කුමක්දැයි හඳුන්වයි.<br>■ කෝලම් උපත් කතාව විස්තර කරයි.<br>■ කෝලම්වල විශේෂ ලක්ෂණ විමසයි.<br>■ කෝලම් රංගභූමියක රූපසටහනක් අඳියි.<br>■ කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ හඳුන්වයි.<br>■ දේශීය ජන නාටක නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | ■ කෝලම් යනු කුමක් ද යි හඳුනාගැනීම.<br>■ කෝලම් උපත් කතාව<br>■ කෝලම් රංග ශෛලියේ ලක්ෂණ<br>■ තානායම් පොළ හා එහි කාර්යයන්<br>■ කෝලම් රංගයක් ඉදිරිපත් කරන ආකාරය | 4.2.2 කෝලම් වගතුග විමසමු (සිද්ධාන්ත) | 01 |
| සමස්තය | | | | | 13 |